# විජයග්‍රහණය

පාර්ලිමේන්තුවේ 5/6 ක ජනවාරමක් ලබා ශ්‍රී ලංකාවේ රාජ්‍ය බලය ලබාගත් ජේ ආර් ජයවර්ධන මහතා ශ්‍රී ලංකාවට ජනාධිපති පදවිය හඳුන්වා දුන්නේය. එතැන් පටන් ශ්‍රී ලාංකික රාජ්‍ය පාලනයේ ඉතා බලවත්ම හස්තය ලෙස ක්‍රියාත්මක වූ මෙම තනතුරට කළ නොහැක්කේ ගැහැනියකු පිරිමියකු කිරීම පමණක් බව ඔහු විසින්ම එදා ප්‍රකාශ කළ බව අප මතකයේ තවමත් රැඳී ඇත . ඒඒ ය එතරම්ම අසීමිත බලතල ඇති තනතුරක් නිසාමය.

පසුගිය 26 වන දා මෙම පදවියට තවත් ජනාධිපති කෙනෙකු තෝරා පත් කර ගැනීම සඳහා ජනාධිපතිවරණයක් පවත්වන ලදී . මෙම ලිපියේ අරමුණ එම මැතිවරණයේ ආරම්භයේ සිට අවසානය දක්වා කෙටි විවරණයක යෙදීමයි.

මෙම මැතිවරණ ක්‍රියාවලිය ආරම්භ කළේ ම චරිත ඝාතන මඩ ප්‍රචාර ප්‍රචණ්ඩ ක්‍රියා වැනි ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියා වලිනි. දිනෙන් දින අප පසුපසට වේගයෙන් ගමන් කරන බව කියාපාන මැතිවරණ ආරම්භය කණගාටුව හා කළකිරීම දනවන සුළු ය. සාමාන්‍යයෙන් මැතිවරණයකදී ජනතාව අමතන ප්‍රධාන ක්‍රම දෙකක් තිබේ. එනම් ජනතා රැළි මගින් කෙළින්ම ජනතාව ඇමතීම හා වෙනත් සන්නිවේදන මාධ්‍ය හරහා ජනතාව ඇමතීමයි. එහිදී අන්තර්ජාලය ගුවන්විදුලිය රූපවාහිණිය පමණක් නොව පත්තර සඟරා බැනර් කටවුට් වැනි මුද්‍රිත මාධ්‍ය ද ඉතා විශාල වශයෙන් දායකත්වයක් ලබා දෙයි. කරුනු කෙසේ වුව ද මෙම මැතිවරණයේදී රජයේ හා පුද්ගලික මාධ්‍ය ආයතන කොතෙක් දුරට අපක්ෂපාතී වූයේද යනු සවිස්තරාත්මකව ඔබට කිව යුතු නොවේ. රාජ්‍ය මාධ්‍ය පැය 24 තුළම ඉතා පහත් අන්දමේ චරිත ඝාතන තුළින් ප්‍රධාන විපක්ෂය කෙරෙහි ජනතා සිත් සතන් තුළ පිළිකුලක් ඇති කිරීමට ගත් උත්සාහය ශ්‍රී ලංකා ඉතිහාසයේ මෙතෙක් නොවුණ නින්දිතම ආකාරයෙන් කෙරුණ බව කිව යුතුය. මැතිවරණ කොමසාරිස් මෙම ඒකපාක්ෂික නීතිවිරෝදී ක්‍රියාවලිය හමුවේ සාධාරණය හා සදාචාරය උදෙසා සටන් කිරීමට නොගත් උත්සාහයක් නොමැත . ඔහු මාධ්‍ය හැසිරවීම උදෙසා නිසි බලධාරියකු පත් කර තත්වය සමනය කිරීමට වෙර දැරුවද එයිනුත් පලක් වූයේ නැත . මෙය ඉතා පිළිකුල් ආකාරයෙන් කෙරෙනු දැකීම නොඉවසූ මල්වතු අස්ගිරි මහනායක හිමිවරුන් ජනාධිපති තුමාට ලිපියක් මගින් රජයේ මාධ්‍ය කටයුතු කරන ආකාරය පිලිබඳව ඔහුන්ගේ අප්‍රසාදය පළ කරන ලදී . දණ නමස්කාර කර වැඳ පුදාගෙන පිරිත් නූල් පන්දු ගණනින් අත දවටාගෙන තමන්ට ආශිර්වාද ලබා ගන්නා අපේ පාලකවරු බොහෝ දෙනෙක් බුද්ධ වචනය ප්‍රිය නොකරන බව මහනායක හිමිවරු නොදන්වා විය නොහැකිය.

මැතිවරණ කාලය පුරාවටම පොලිසියට නීතිය ක්‍රියාත්මක කිරීමට නොහැකිව අසරණ තත්වයකට පත් කර තිබුනි. ප්‍රචණ්ඩ ක්‍රියා වලින් අහිසංක ජීවිත 7 ක් මිහිදන් විය. මැතිවරණ නිරීක්ෂණ නිලධාරීන්ට ප්‍රකාශ නිකුත් කරනවා හැර ඉන් එහා දෙයක් කර ගැනීමට ශක්තියක් හෝ බලයක් හෝ ලැබී නොතිබුණි. රාජ්‍ය සම්පත් දේපොල හා රාජ්‍ය බලය කිසි සේත් කිසිම බයක් සැකක් චකිතයකින් තොරව රජය විසින් යොදා ගන්නා ලදී .

මෙම අත්තනෝමතික ක්‍රියා දාමයන් හමුවේ කිසිම ආකාරයකින් විපක්ෂට නැගී සිටීමට යම් හෝ ඉඩක් ඇත්නම් රාජ්‍ය මාධ්‍ය හා රාජ්‍ය බලය එම ඉඩ අසුරාලීමට වග බලා ගත්තේය. රජය මෙම මැතිවරණය සඳහා වියදම් කරන ලද බිලියන ගණනක මුදල් සම්භාරය අප වැනි දුප්පත් රටකට කෙසේත් ඔරොත්තු නොදෙන බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

මාධය ගැන කතා කිරීමේදී ඔස්ට්‍රේලියාවේ මාධ්‍ය සගයන් හැසිරුණ ආකාරය ගැන ද යම් සටහනක් තැබිය යුතු ය. තරු පහේ ප්‍රජාතාන්ත්‍රික රටක ජීවත් වන අපි ක්‍රියා කළ යුත්තේ එම මූලධර්ම වලට ගරු කරමිනි. මෙහි නොම්මර තහඩු නැති සුදු වෑන් හෝ බෙලි හෝ කට කපන බලකායන් නොමැත . නමුත් මෙම මාධ්‍ය විශ්ලේෂකයන් ගේ දේශණා වූයේ දිගින් දිගටම රජයේ ගුණ වැනීම හා විපක්ෂ අපේක්ෂකයාට පහර ගැසීමයි. තවත් පැත්තක මාධ්‍ය ගටයකු පදික වේදිකාවක බඩු විකුණන්නකු මෙන් රජයේ ගුණ වැනීම සිදු කළේ කිසිදු දේශපාලන අවබෝධයකින් තොරව බව කිව යුතු ය. මෙම මාධ්‍ය විශලේශකයන් සගයන් හා ගැටයන් සියල්ලම පුන පුනා රජයේ ගුණ වයමින් රාජපාක්ෂික භාවය වසන් කිරීමට උත්සාහ කළ ද මෙරට වෙසෙන බුද්ධිමත් ජනතාව රැවටීමට ඔවුන්ට නොහැකි බවද කිව යුතු ය. ඔවුන් මෙවැනි රටක ජීවත් වෙමින් ජනතාවට සත්‍යය දැනගැනීමට ඇති පරම අයිතියට ගරු නොකරන්නේ සදාචාරයට පයින් ගසමින් බඩගෝස්තරවාදය උදෙසා බව තේරුම් ගැනීමට අපහසු නැත. උදාහරණයක් ලෙස එක් ඊනියා මාධ්‍ය විශලේෂකයකු ප්‍රකාශ කළේ මෙම මැතිවරණයේ අවසනා කාලය කිට්ටු වන විට කුල බේධය එකතු වන බවය. මොවුන් ජීවත් වන්නේ මෙම ශතව වර්ශයේදැයි සිතෙන තරමට මෙම ප්‍රකාශ පුදුම සහගතය. වාසනාවකට මෙන් සමාජ දූෂක විශබීජ ගෙනහැර පාන මෙවැනි ප්‍රකාශ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක නොවීම කොතරම් භාග්‍යයක් ද. අවසන් මොහොතේ මෙම මාධ්‍යවේදියාගෙ "ම මුවින් බළලා මල්ලෙන් එලියට පැන්නාක් මෙන් ඇත්ත පිටවිය. ඔහු එදා කියා සිටියේ මහින්ද රාජපක්ෂ මහතා නියත වශයෙන්ම මැතිවරණය ජය ගන්නා බවත් ඒ ඔහු හොඳ මිනිසකු නිසා නොවන බවත් ය. ඇට නැති දිවෙන් ඊළඟට මහින්දගේ ජයග්‍රහණයෙන් පසුව එතුමාගේ ගුණ ගී වයමින් විපක්ෂය උපහාසයට හා අපහාසයට ලක් කළේ ද ඔහුම ය. තවත් මාධ්‍යයක "අඟුරු කබල" මැතිවරණය කිට්ටු වන විට කිනම්ම නිවී ගියේ ය. තවත් ආචාර්යවරයකු මෙම මාධ්‍යවල ආධාරයෙන් ඡන්දය පාවිච්චි කළ යුත්තේ කාටද කෙසේද යන උපදෙස් ප්‍රකාශ කළේ ය. මෙම උගත් ආචාර්ය තුමාට ලංකාවේ පුරවැසිභාවය වත් තිබේදැයි සැක සහිතය. කෙසේ වුවත් එතුමා එවැනි කටයුතු සඳහා තෝරා ගත යුතුව තිබුණේ රූපවාහිණිය සිරස හෝ තමන්ගේ පුද්ගලික මාධ්‍ය ජාලයක් විනා ඔස්ට්‍රේලියාවේ පොදු සමාජ ගුවන්විදුලියක් නොවේ. ඔස්ට්‍රේලියාවේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට මෙම රජයෙන් ලැබී ඇති මෙම බොහෝ මාධ්‍ය ආයතන නඩත්තු වන්නේ යම් ප්‍රමාණයකින් ජන සමාජයේ ජීවත්වන අයගේ ද ආධාරය හා උපකාරය ඇතුව බව මෙම සියලු මාධ්‍ය ආයතන වලට මතක් කර දෙනු කැමැත්තෙමි. ඒ නිසාවෙන් ඒකාපාක්ෂිකව කටයුතු නොකර අප සමාජයේ ජීවත්වන විවිධ දේශපාලන අදහස් දරන සැමගේම අදහස් වලට ගරු කරමින් කටයුතු කරන්නේ නම් කොයි තරම් අගනේ ද? තම තමන්ගේ පුද්ගලික දේශපාලන මතවාද අසන්නන් වෙත බලෙන් පටවන්නට තැත් කිරීමේ සදාචාරාත්මක බව කුමක් ද? ඒ අතින් එස්බීඑස් ගුවන් විදුලි ආයතනය අපක්ෂපාතීව කටයුතු කිරීම ගැන අප ඔවුන්ට අපේ ප්‍රසාදය පිරිනමමු.

**මාධය ගැන කතා කිරීමේදී ඔස්ට්‍රේලියාවේ මාධ්‍ය සගයන් හැසිරුණ ආකාරය ගැන ද යම් සටහනක් තැබිය යුතු ය. තරු පහේ ප්‍රජාතාන්ත්‍රික රටක ජීවත් වන අපි ක්‍රියා කළ යුත්තේ එම මූලධර්ම වලට ගරු කරමිනි. මෙහි නොම්මර තහඩු නැති සුදු වෑන් හෝ බෙලි හෝ කට කපන බලකායන් නොමැත . නමුත් මෙම මාධ්‍ය විශ්ලේෂකයන් ගේ දේශණා වූයේ දිගින් දිගටම රජයේ ගුණ වැනීම හා විපක්ෂ අපේක්ෂකයාට පහර ගැසීමයි. තවත් පැත්තක මාධ්‍ය ගටයකු පදික වේදිකාවක බඩු විකුණන්නකු මෙන් රජයේ ගුණ වැනීම සිදු කළේ කිසිදු දේශපාලන අවබෝධයකින් තොරව බව කිව යුතු ය. මෙම මාධ්‍ය විශලේශකයන් සගයන් හා ගැටයන් සියල්ලම පුන පුනා රජයේ ගුණ වයමින් රාජපාක්ෂික භාවය වසන් කිරීමට උත්සාහ කළ ද මෙරට වෙසෙන බුද්ධිමත් ජනතාව රැවටීමට ඔවුන්ට නොහැකි බවද කිව යුතු ය. ඔවුන් මෙවැනි රටක ජීවත් වෙමින් ජනතාවට සත්‍යය දැනගැනීමට ඇති පරම අයිතියට ගරු නොකරන්නේ සදාචාරයට පයින් ගසමින් බඩගෝස්තරවාදය උදෙසා බව තේරුම් ගැනීමට අපහසු නැත.**



එනමුදු ඡන්දය දැන් අවසන් වී ඇත . ජනාදිපති මහින්ද රාජපක්ෂ මහතා අතිවිශිෂ්ට ජයක් අත්කරගත්තේය. ප්‍රතිඵලය ගැන විපක්ෂයෙන් නොයෙකුත් චෝදනා අසන්නට ලැබේ. ඕනෑම මැතිවරණයක් අවසානයේ මෙවැනි චෝදනා අසන්නට ලැබේ. මෙයත් සමහර විට එවැනි අදෝනා විය හැකිය. නමුත් මෙම මැතිවරණය අවස්ථාවේ ශ්‍රී ලංක ාමැතිවරණ ඉතිහාසයේ වෙන කිසිමදාක නොවූ ආකාරයේ ප්‍රකාශයක් මැතිවරණ කොමසාරිස්වරයා විසින් කරන ලදී . එනම් "මෙය සම්ප්‍රදායානුකූලව ප්‍රතිඵල නිකුත් කිරීමක් මිස නීත්‍යානුකූල එකක් නොවන බව" ය තවද මැතිවරණ කොමසාරිස් කෙනෙකුගේ ප්‍රධාන කාර්යය වන ඡන්ද පෙට්ටි ආරක්ෂා කරගැනීම වත් තමාට කරගන්නට නොලැබුණ බව ජනාදිපති ඉදිරියේම ඔහු ප්‍රකාශ කළේ ය. ඒ කෙසේ වෙතත් ඔහුද අසරණ වූ රාජ්‍ය නිලධාරියෙකි. තව නොබෝ දිනකින් ඔහුගේම මුවින් මැතිවරණය ඉතා සාධාරණව පැවැත්වූ බව ප්‍රකාශ කිරීමට සිදුවනු ඇත . නොඑසේ නම් වංචා සහගත මැතිවරණයක් මහජන මුදල් නාස්තිකර පැවැත්වූයේ යයි නඩුවක් පැමිණවිය හැකි දෙපැත්ත කැපෙන කඩුවක් රජය සතු බව ඔහු හොඳින්ම දනියි.

ලිපිය අවසන් කිරීමට මත්තෙන් තවත් සුවිශේෂ කරුණක් සිහිගන්වනු කැමැත්තෙමි. ශ්‍රී ලාංකික අපේ සිතුම් පැතුම් මෙන්ම පුද්ගලයන් හඳුනා ගන්නා සංවේදීතාවක් හා අදහස් වෙනස් වන වේගය සැළකිල්ලට භාජනය කළ යුතු ය. වසර 2009 මැයි මාසයේදී ජෙනරාල් සරත් ෆොන්සේකා යුද වීරයෙකි. එම වසරේදීම සැප්තැම්බර් මාසය වන විට ඔහු මව්බිමේ ද්‍රෝහියෙකි. 2010 ජනවාරි මාසය වන විට ඔහු එල්ටීටීඊ කාරයෙකි. එවන් දේශයක් කෙරෙහි දෙවිනුත් බැල්ම හෙළන්නේ සැක සංකා සහිතවය. ඒ අ යසත්‍යය දිනෙක දැනගනු ඇත . එතෙක් අප තීරණ නොගෙන විමසිල්ලෙන්

බලා සිටීම වැදගත් යයි මම සිතමි.

**නිර්පාක්ෂික**